# මා දුටු කන්තලේ



## උමයන්තිගේ මතක සටහන්



මෙම නම හා සමගම සීනි කර්මාන්ත ශාලාව කාගේත් මතකයට එනවා. සීනි කර්මාන්ත ශාලාව එකල රටේ ආර්ථිකය ගොඩනැන්වීමට විශාල වශයෙන් දායක වූ බව කවුරුත් දන්නා කරුණක්. වර්තමානයේ මේ සම්බන්ධව නොයෙකුත් ගැටළු පැන නැගී ඇති අතර වැඩිහිටි පිරිස් සීනි පරිබෝජනය අවම කර වෙනත් ආදේශකයන්ටත් හුරු වී සිටිනවා. මීට මාස කීපයකට පෙර මම ලංකාවට ගිය අවස්ථාවේ සෝමාවතී වෙහෙර වැඳ පුදාගෙන යන අතර කන්තලේ නගරය දැක බලාගැනීමටත් අස්ථාවක් උදාවුනා.

මා පාසලේ බාලාංශ පන්ති වල ඉගෙනුම ලබන කාලයේ ගිය එම ගමනේදී මුලින්ම කන්තලේදී දුටු දසුන් හා යම් මතකයන් සම්බන්ධ කර ගනිමින් මෙය ලිවීමට සිතුනා. මගේ පියාට සිටි එකම සොයුරිය මගේ නැන්දා. ඇය තරුණ වයසේදී ඇති කරගත් පෙම් සබඳතාවයට මගේ සීයා තදින්ම විරුද්ධ වූ බැවින් ඔවුන් රහසේම විවාහ වී අති දුෂ්කර පලාතක් වූ කන්තලේ පදිංචියට ගියත් මගේ පියා සීයාට හොරෙන් ඔවුනට උදව් කලා.එක් පාසල් නිවාඩු කාලයක තාත්තා අපත් සමඟ කන්තලේ ගියේ නැන්දාට තිබුන සෙනෙහස නිසාමයි. මේ ගමනට බාප්පගෙ පවුලේ අයත් එකතු වුනා.

මට මතකයි අපි පාන්දරින්මයි පිටත් වුනේ. බස්රිය රූස්ස ගස් වන මූකලන් පසු කරමින් බොහෝ වේගයෙන් ගමන් කලා. සෑහෙන දුර ගමන් කරන බස් රථය විශාල වෘක්ෂයන් ලඟ නතර කළ විට මගීන් කීපදෙනෙක් බසයට ගොඩ වෙනවා. එකල බස් නැවතුම්පළවල් තිබුණේ ඒ විදිහටයි.බස් රථයට ගොඩවන කීපදෙනෙක් අත පන්මලුත් තවකීප දෙනෙක් කඩදාසි උරත් තිබුණා. තවත් කිහිප දෙනෙක් කිලිටි ඇඳුම් ඇඳගත් දරුවන් සමග බස් රථයට ගොඩ වෙනවා මට මතකයි. ඒ සෑම මුහුණකම තිබුනේ දුක්බර බයාදු පෙනුමක්.

මගේ නැන්දලා පදිංචි වී සිටියේ අග්බෝපුර. ඒ දිනවල මාමා සීනි කර්මාන්ත ශාලාවේ රැකියාවක් කරමින් සිටියා. වන මූකලානකින් වටවුන පුංචි නිවසක් හා වෙන කිසිම නිවසක් පේන තෙක් මානයක නැති විදුලි බලය නැති පාලු පරිසරය දුටු මම ගෙදර එක්කර ගෙන යන්න කියල අඬපු හැටි මට තාමත් මතකයි. එදින රෑ හදපානේ පැදුරු එලාගෙන වැඩිහිටි පිරිස මැද ළමා පිරිසට වැටිල ලස්සණ රටාවකට අප වටා කැරකෙන කලාමැදිරි එලි දිහාත් බලා ගෙන මාමගෙ කතන්දරත් බාප්පගෙ විහිලු කතාත් අසමින් පිරිසට වැටුනම මගේ පාළු ගතිය මග හැරී පරිසරයට හුරු වුන අයුරු අද මගේ මතකයට නැගෙන විට හිතෙන්නේ ස්වාභාව ධර්මය යනු පුංචි මනසක් වුවත් වෙනස් කරන්න තරම් චමත්කාර බලයක් ඇති මහා බලගතු දෙයක් විදිහටයි. පසුදා උදේ අපි සියලුදෙනා අත් ට්‍රැක්ටරයක නැගී සීනි කර්මාන්තශාලව හා කන්තලේ වැව නැරඹීමට ගිය අවස්ථාව කිසි කලකත් අමතක නොවන සොදුරු මතකයන් වන්නේ අද දරුවනට වගේම මතු පරපුරකටවත් එවන් සොදුරැ අවස්ථාවන් උදානොවන නිසා යම් වේදනාවකුත් සමගින්. මුලින්ම ගියේ මාමා වැඩ කල සීනි කර්මාන්තශාලාව බලන්නටයි. ළමා අපිට මේ ගමන විනෝදජනක එකක් වුවා සේම කවුරුත් අපට ආදරෙන් සැලකුවා.උග්ගස් දැක්කෙත් එපා වෙනකම්ම කන්න ලැබුනෙත් එදින තමයි. ඊට පසුව මට උග්ගස් දකින්න ලැබුනේ වේල් කෝවිල් වල උත්සව වලදීයි. සීනි හැදෙන හැටි කියා දුන්නත් යන්ත්‍ර වලින් දුටුවත් විස්තර කිරීමට තරම් මතකයක් නැහැ. කාන්තාවන් වතුවල වැඩ කරමින් සිටිනව දුටු බව මතකයි.නැන්දා පාන්දරම කෑම උයල කෙසෙල් කොලවල ඔතා ගෙන ආපු කෑම පාර්සල් වල අමුතුම රසවත් බවක් තිබුන බවනම් මගේ මතකයේ තිබෙනවා. විශේෂයෙන්ම සඳහන් කල යුතු වන්නේ අප ආ මග වනරොදවල් අසලත් කන්තලේ වැව අසබඩදීත් අලි ඇතුන් දක්නට ලැබීමයි.බෙල්ලන්විල පෙරහැරේදී ලස්සණ ඇදුමකින් සැරසිල ධාතු කරඬුව පිටින් බොහෝම ගරු ගාම්භීරව ගමන් කරන අප ලඟින් ගමන් ගන්නා විට බයටම තව ටිකක් පස්සට වෙන එකල නපුරු බියකරු ඇත් රූපයක් තමා මගේ සිතේ ඇදී තිබුණේ.නමුත් මෙම ගමනේදී මම දැකපු අදටත් මනසේ තදින්ම කා වැදී ඇති සුන්දරම මතකය වන්නේ ඇත් පවුලක් තම පැටවුන්ද සමගින් වැව අසබඩ සතුටින් සෙනෙහස පාමින් නිදහසේ ගතකල අන්දමයි. වර්තමානයේ නම් අලි ඇතුන්ට හිමිවිය යුතු තැන් අහිමි කිරීම තුළින් මිනිසා විසින්ම විශාල අසාධාරණයකට ලක්කර තිබුනත් සෙනෙහස කරුණාව සතුන් ගාවත් දක්නට ලැබෙනවා. එකල වැව අසල ගස්වැල් වලින් සෙවණ සැදි අධික අව් රශ්මියට සිසිලසක් ලබාදුන් කන්තලේ දක්නට ලැබුන සුන්දරම ස්ථානය වන්නේ කන්තලේ වැවයි. කන්තලේ වැව හා වනගහනය නිසා අදටත් මෙහි සුන්දරත්වය නොනැසී පවතිනවා. සීනි කර්මාන්ත ශාලාව රටේ ආර්ථිකය නගා සිටුවීමට විශාල වශයෙන් දායක වීමත් සමගම රැකියා අවස්ථා වැඩි වී ජනගහණය වැඩිවී වී ගොවිතැන්ද නව පාසල්ද බිහි වී උගත් පරපුරක් රටට බිහිකලත් අද වනවිට සීනි කර්මාන්ත ශාලාව වල් බිහි වූ පරිසරයක් මැද යකඩ ගොඩක් බවට පත්වී පත් වී තිබීම ඛේදනීය තත්වයක්.



උණුවතුර ළිං බැලීමට ත්‍රිකුණාමලයේ ගියේ ඊට පසු දිනයි. ඒ ගමනත් විනෝදජනක වුනේ මාමලගෙ විහිළු කතා නිසා බව මතකයේ තියෙනමුත් විස්තර කිරීමට තරම් මතකයක් නැත. ත්‍රිකුණාමලයේ ඊට පසු කාලවලත් යන්නට ලැබුණ නිසා මට හිතෙන්නේ එකල දක්නට ලැබුන ස්වාභාවික ළිං තුළ දැක්ක වටිනාකමක් අද නම් දක්නට නැති තරමට නවීකරනය වීම හා රටේ සෑම දිශාවකින්ම එන පිරිස් වැඩිවීම නිසා පරිසරයේ විශාල වෙනසක් සිදුවී ඇති බවයි.

පසු කලක දැනගත් තොරතුරු වලට අනුව කන්තලේ වැවේ නිර්මතෘ දෙවන අග්බෝ රජතුමායි. එකල මෙය හැදින්-වූවේ ගන්තලාව නමින් වුවත් පසු කලක දමිළ පිරිස් අතර වචන උච්චාරණයේදී කන්තලෙයි නමින් කියන්න ලියන්න හුරු වූ නිසා මෙය කන්තලේ නමින් වෙනස් වී ඇති අතර යටත් විජිත සමයේ අවධානයට ලක් නොවූ ප්‍රදේශයක් බවට පත් වුවත් ඉන්පසු කාල වලදී සීනි කර්මාන්තශාලාව ඉදිවීමත් සමගම මෙය දෙස් විදෙස් රටවල පවා අවධානයට ලක් වූ නගරයක් බවට පත්වී බීජ ගොවි පොලවල් එලවළු බෝග වගා ඇතුළු අමතර බෝග වගාවන් සුපර්මාකට් ඩිස්පැන්සරි ගමනාගමන පහසුකම් වලින් අංගසම්පූර්ණ නගරයක් වූ කන්තලේ අද පාලකයන්ගේ වරදින් විශාල ඛේදවාචයකට මුහුණ පා ඇති නමුත් නොනැසී පවතින සුන්දරත්වයත් ඉපැරණි නටබුන් නිසාත් දෙස් විදෙස් සංචාරකයින්ගෙන් මේ පුරවරය පිරී පවතිනවා.

